# අලුත්වූ සොයුරු පෙම



# අළුත් වූ

# සොයුරු පෙම

## කතෘ ගයන්සා වර්ණකුලසූරිය

කතෘ ගයන්සා වර්ණකුලසූරිය

මහාමයා බාලිකා විදුහල මහනුවර

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් මප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිතසමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේවිභවතා හඳුනාජෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙසහැඩගැස්වීම අපගේ වගකීමයි.එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුවයමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායාදියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයටයොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක්වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයප්‍රහණයක් මෙන්ම කාලීන ජාතිකඅවශ්‍යතාවයක් සපුරාලීමකි.එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවරඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් දිවිය

දිනන විද්‍යුත් පොතක ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම්සමුදායක්මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපනඅමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහිනදකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය ක් දිවිය දිනන විද්‍යුත්පොතක්v ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු

අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා ප්‍රාර්ථනා කරමු.මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය

ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළවිදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට

හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

මාගේ මෙම පොත මහාමායා
බාලිකා මහා විදුහලේ
විදුහල්පතිතුමිය සහ

මාගේ පන්තිභාර

ගුරුමෑණියන්ට සහ

මා හට අකුරු කළ ගුරු
මෑණිවරුන්ට

ඉතා ආදරයෙන් හා ගෞරවයෙන්

පුද කරමි

දුර ඈත  පලාතක ලස්සන ගමක් තිබුනා. මේ ගමේ පොඩි ළමයි දෙන්නෙක් හිටියා. එක්කෙනෙක් තමා  සනුකි අනෙක්කෙනා තමයි දසුනි.මේ දසුනි හරිම හිතුවක්කාරයි. අම්මයි තාත්තයි කියන කිසි දෙයක් අහන්නෙ නෑ.



දවසක් මේ දසුනි තාත්තත් එක්ක  ටවුමට ගියා. ගිහිල්ලා දකින හැමදෙම ඉල්ලලා බිම පෙරලි පෙරලි අඩනවා. දසුනිගේ තාත්තට හරිම ලැජ්ජයි.



ඒත් සනුකි එහෙම නෑ. එයා හොද  ළමයෙක්
අම්මයි තාත්තයි කියනදේ අහගෙන හොදින්
ඉගෙනගෙන අන් අයට  උදව්කරන කෙනෙක්
තමයි සනුකි කියන්නේ.



කොහොම හරි මේ සනුකියි දසුනියි එකම ඉස්කෝලේ එකම පන්තියකට වැටුනා. දසුනි කරන්නෙම දඟ වැඩ. ගුරුවරු කියන කිසිම දෙයක් අහන්නෙම නෑ. දසුනිගේ අම්මයි තාත්තයි දසුනිගේ වැරදිවලට ගොඩක් පාරක් ඉස්කෝලේට ආවා.



ඒත් කවදාවත් සනුකි දඟවැඩ කලේ නෑ. අම්මයි තාත්තයි කියනදේ අහගෙන හොදින් වැඩකලා.

ඔන්න එක දවසක් සනුකිලාගෙ පන්තියේ විභාගයක් තිබුනා. එකෙන් සනුකි පන්තියෙ පළවෙනියා වුනා.

දසුනි පන්තියෙ අන්තිමයා වුනා. දසුනිට සනුකි ගැන ඉරිසියාවක් ඇති වුනා.දසුනි සනුකිට කරදරමයි

කරන්නේ. හැමදාම එයා කරන වැරදි වලට

සනුකිවමයි අහුකරලා දෙන්න.

දවසක් සනුකි දසුනිගෙන්  ඇහුවා " ඔයා ඇයි මට කරදර කරන්නේ " එතකොට දසුනි කිව්වා " ඔයානේ ඉතින් පන්තියේ පලවෙනියා ඔයා පන්තියෙ පලවෙනියා නිසා මට හැමෝම බනිනවා මට ඉගෙන ගන්න බෑ කියලා. ඔක්කොම ඔයා නිසා

තමයි.කියලා දසුනි සනුකිව තල්ලු කලා එතකොට සනුකිගේ ඔලුව බිත්තියෙ වැදීලා ඔලුවපැලිලා ලේ ගොඩක් ගැලුවා. එතනට මැඩම්ලා ගොඩක් ඇවිල්ලා සනුකිව ඉක්මනින් ඉස්පිරිතාලෙට ගෙනියච්චා.

දසුනි හොදටම බය වුනා. පහුවදා දසුනි සනුකිව බලන්න ඉස්පිරිතාලෙට ගියා. දසුනිට සනුකි දැකලා ඇඩුනා.

එතකොට සනුකි දසුනිට එන්න කියලා මෙහෙම කිව්වා. " මම ඔයත් එක්ක තරහා නෑ . ඔයා තමා අද ඉදලා මගේ හොදම යාලුවා." කියලා සනුකි කිව්වා. ඒට පස්සෙ ඒ දෙන්නා බදාගත්තා සනුකිට හරිම සතුටුයි. ඒ දෙන්නා ඒට පස්සේ හොදම යාලුවෝ වුනා.

ඒ දෙන්නා යාලුවෝ වුනාට පස්සේ දසුනි දගවැඩ , නරක වැඩ නවත්තවුවා. අනික් අයට

උදව් කෙරුවා. ගුරුවරු පවා දසුනි ගැන
ආඩම්බර වුනා.  දසුනිත් හොද ළමයෙක් වුනා.
පාසලේ වැඩත් හොදින් කරා.හොද යහලුවෝ
හින්දා අපට හැමදාමත් යහපතක් තමයි. ඒ
නිසා අපි හැමදාමත් හොද යාලුවෝ  ඇසුරු
කරමු.



පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්v ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඥදුපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක 2023 . 11 . 01